සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

**11 - ශ්‍රේණිය**

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය -I, II**

**නම/විභාග අංකය : ................................................................... කාලය : පැය 03 යි.**

## I පත්‍රය

**උපදෙස් :**

- **සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**
- **දී ඇති පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ' x' ලකුණ යොදන්න.**

- පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කොරෝනා වෛරස තත්වය මත වෙළෙඳපොළේ මුඛ ආවරණ සඳහා අධික ඉල්ලුමක් නිර්මාණය විය.ඇතැම් ව්‍යාපාරික කොටස් ඒවායේ මිල ගණන් හිතුමතයේ ඉහළ නැංවීය. මෙම තත්වය පාලනය කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යංශය මුළු ආවරණ උදෙසා උපරිම මිලක් නියම කරන ලදි. තවද රජයේ ඔසුසල් මුඛ ආවරණ රජයේ අනුමත මිලට අලෙවි කිරීමට ඉදිරිපත් විය.

01. රජයේ ඔසුසල් සපුරාලනු ලබන මිනිස් අවශ්‍යතාවය කුමක් ද?

| | | | |
|---|---|---|---|
| 1. | ආරක්ෂාව | 2. | ඇඳුම් |
| 3. | සෞඛ්‍යය | 4. | අධ්‍යාපනය |

02. අවශ්‍යතාවල දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණයක් වන්නේ,

| | | | |
|---|---|---|---|
| 1. | අත්‍යවශ්‍ය වීම | 2 | විවිධ වීම |
| 3. | සංකීර්ණ වීම | 4. | අසීමිත වීම |

03. සිද්ධියට අදාළ වන රාජ්‍ය ඔසුසල්හි ව්‍යාපාර අරමුණ වන්නේ,

1. භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමයි.
2. සාධාරණ මිලකට ගුණාත්මක භාණ්ඩ ලබා දීමයි.
3. ආර්ථික කටයුත්තක නියැලීමයි.
4. සේවක බඳවා ගැනීම හා අභිප්‍රේරණයයි.

04. ව්‍යාපාරයක බාහිර පරිසර සාධක පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. දේශපාලන පරිසරය, අයිතිකරුවෝ, ආර්ථික පරිසරය
2. තාක්ෂණික පරිසරය, ණයදෙනුකරුවෝ, ගෝලීය පරිසරය
3. ආර්ථික පරිසරය, සේවකයෝ, තාක්ෂණික පරිසරය
4. ආර්ථික පරිසරය, ගෝලීය පරිසරය, කළමනාකරුවෝ

05. '2020 ජනවාරි මස සිට බැංකු ණය පොළී අනුපාතය 2% කින් පහළ දැමීමට තීරණය කර ඇත.' මේ නිසා ව්‍යාපාර වලට වන බලපෑම දැක්වෙන වඩාත් ම නිවැරදි පිළිතුර වන්නේ,

1. ව්‍යාපාරය විසින් ණය ගැනීම සීමා කිරීම.
2. භාණ්ඩ හා සේවා වල විකුණුම් මිල ඉහළ දැමීම.
3. ව්‍යාපාර විසින් ණය ගැනීමට පෙළඹවීම.
4. ව්‍යාපාර විසින් බැංකු ගිණුම්වල මුදල් තැන්පත් කිරීම ඉහළ යාම.

06. ව්‍යාපාරයකට පිළිගත් සන්නම් නාමයක් තිබීම ......①....... වන අතර යටිතල පහසුකම් වැඩි දියුණු වීම ව්‍යාපාරයට .......②..... වේ.

ඉහත ප්‍රකාශයේ ① හා ② යන ස්ථානවලට අදාල නිවැරදි යෙදුම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. අවස්ථාවක්, ශක්තියක්
2. අවස්ථාවක්, දුර්වලතාවයක්
3. ශක්තියක්, අවස්ථාවක්
4. තර්ජනයක්, ශක්තියක්

07. ව්‍යාපාර සංවිධානයක් තෝරා ගැනීමේ දී පදනම් වන ප්‍රධාන අරමුණු දෙක වන්නේ,

1. ලාභ ලැබීම, අඛණ්ඩ පැවැත්ම
2. ලාභ ලැබීම, භාණ්ඩවල ගුණත්වය
3. ලාභ ලැබීම, සමාජික සුභසාධනය
4. ලාභ ලැබීම, මිනිස් අවශ්‍යතා ඉටු කිරීම

08. අසේල අනාගතයේ ව්‍යාපාරිකයෙකු වීමට සිහින දකින පුද්ගලයෙකි. මොහු තනිව අවධානම් දැරීමට බියක් දක්වන අතර දැඩි නීත්‍යානුකූල බැඳීම්වලින් තොරව පහසුවෙන් ව්‍යාපාර පවත්වා ගෙන යාමට ද අදහස් කරයි. ඒ අනුව අසේලට ආරම්භ කිරීමට වඩා සුදුසු ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,

1. ඒක පුද්ගල ව්‍යාපාර
2. හවුල් ව්‍යාපාර
3. සංස්ථාපිත සමාගම්
4. සමිති සංවිධාන

09. ඒක පුද්ගල ව්‍යාපාරයක නාමය ලියාපදිංචි කිරීම තුළින් අත්වන ප්‍රයෝජනයක් වන්නේ,

1. ව්‍යාපාරයට අඛණ්ඩ පැවැත්මක් ලැබීමයි.
2. ව්‍යාපාරයට නෛතික පුද්ගලභාවයක් ලැබීමයි.
3. බදු නිදහස ලැබීමයි.
4. ව්‍යාපාරයට අනන්‍යතාවයක් ලැබීමයි.

10. ණයපත් හා හරපත් යන විද්‍යුත් මුදල් කාඩ්පත් වල VISA යන යෙදුම් දක්නට ඇත. මෙම යෙදුම් සහිත කාඩ්පත් ක්‍රියාත්මක වන්නේ,

1. අභ්‍යන්තර ණයපත් ජාල වශයෙනි.
2. ජාත්‍යන්තර ණයපත් ජාල වශයෙ
3. ලංකා බැංකුවේ ණයපත් ජාල වශයෙනි.
4. මහ බැංකුවේ ණයපත් ජාල වශයෙනි.

11. රත්න චොකලට් නිෂ්පාදන ව්‍යාපාරයක නිරත වන අතර ඔහු තම ජංගම ගිණුම් මහජන බැංකුවේ බෙලිඅත්ත ශාඛාවේ පවත්වා ගෙන යයි. මාතලේ ලංකා බැංකුවේ ජංගම ගිණුම් පවත්වා ගෙන යන පියල්ගෙන් රු. 80 000 ක් වටිනා කොකෝවා තොගයක් මිලදී ගෙන රත්න පියල්ට චෙක්පතකින් ගෙවන ලදී. මෙම සිද්ධියට අදාළ අණලදු වන්නේ වන්නේ,

1. රත්න
2. මහජන බැංකුව - බෙලිඅත්ත
3. පියල්
4. ලංකා බැංකුව - මාතලේ

12. නුවන් සිය වෙළෙඳසැලට රක්ෂණ සමාගමකින් ගිනි රක්ෂණ ඔප්පුවක් ලබා ගන්නා ලදි. පසුව ගෑස් සමාගමක නියෝජිතයකු ලෙස ගෑස් බෙදාහැරීමේ කටයුතු ද එම ව්‍යාපාර ස්ථානයේ ම ආරම්භ කළ අතර ඒ බව රක්ෂණ සමාගමට දැනුම් දී නොතිබුණි. ගෑස් කාන්දුවකින් ව්‍යාපාරයේ ගින්නක් හටගත් අතර ඉන් ඇති වූ අලාභය සඳහා වන්දි ඉල්ලූ විට රක්ෂණ සමාගම එය ගෙවීම ප්‍රතික්ෂේප කරන ලදි. වන්දි ගෙවීම ප්‍රතික්ෂේප වීමට බලපෑ රක්ෂණ මූලධර්මය කුමක් ද?

1. රක්ෂණ හිමිකම
2. උපරිම විශ්වාසය
3. හානිපූරණය
4. ආරක්ෂණය

13. ව්‍යාපාරයක් නව සේවාවක් හඳුන්වා දීමේ වෙළෙඳ දැන්වීම අන්තර්ජාලයේ පල කරන ලදි. මෙය,

1. අභ්‍යන්තර විද්‍යුත් සන්නිවේදනයකි
2. අභ්‍යන්තර ලිඛිත සන්නිවේදනයකි
3. බාහිර සංඥා සන්නිවේදනයකි
4. බාහිර විද්‍යුත් සන්නිවේදනයකි

14. මත්තල ගුවන්තොටුපොල ප්‍රවාහන මූලිකාංගයක් වන ............................ වන අතර ඊට පැමිණි එමිරේට්ස් යානය ප්‍රවාහන මූලිකාංගයක් වන ................................. වේ.

1. මාධ්‍යය, පර්යන්තය    2. පර්යන්තය, බලය
3. පර්යන්තය, මාධ්‍යය    4. මාර්ගය, මාධ්‍යය

15. පහත දැක්වෙන්නේ වෙළඳාමක් සිදු වූ අවස්ථා කිහිපයකි.

A - කිරි ගොවියෙකු වූ සුනිමල් නැවුම් කිරි ප්‍රාදේශීය කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයට විකිණීම.
B - විහාරස්ථානයකට දානයක් දීම සඳහා සිරිල් මී කිරි හට්ටි 5 ක් මිලදී ගැනීම.
C - පාසල් ශ්‍රමදානයක් සඳහා බනිස් 100 ක් මිලදී ගැනීම.

ඉහත වෙළඳාම් අතුරින් සිල්ලර වෙළඳාමට අයත් වන්නේ,

1. B හා C    2. A හා B
3. A හා C    4. A B හා C යන සියල්ලම

16. රසකැවිලි නිෂ්පාදන ආයතනයක් ඉදිරි වසරේ දී නිමවුම 20% කින් ඉහළ නැංවීම සඳහා නව ඇඹරුම් යන්ත්‍රයක් මිලදී ගැනීමට තීරණය කරන ලදි. මෙය කළමණාකරණයේ කුමන කාර්යයකට අයත් වේද?

1. සංවිධානකරණය    2. මෙහෙය වීම
3. සැලසුම්කරණය    4. පාලනය

17. පහත සඳහන් කර ඇති ප්‍රකාශ අතුරෙන් නොගැලපෙන ප්‍රකාශය තෝරන්න.

1. ගිණුම්කරණයේ දී අදාළ කරගන්නේ මුදලින් මැනිය හැකි ගණුදෙනු පමණි.
2. ව්‍යාපාරයක හිමිකරුවන්, ණයහිමියන්, ගණුදෙනුකරුවන් වැනි පාර්ශව වලට ව්‍යාපාරික තොරතුරු වැදගත් වේ.
3. මූල්‍යමය තොරතුරු සැපයීමට පවතින ගිණුම්කරණය, මූල්‍ය ගිණුම්කරණය වේ.
4. ගිණුම්කරණයේ මූලධර්ම වලට පදනම වන්නේ ආදායම් හා වියදම් වේ.

18. ව්‍යාපාර අයිතිකරුවන්ගේ හිමිකම ලබා ගත හැකි වරණය තෝරන්න.

1. වත්කම් + වගකීම්    2. වත්කම් - වගකීම්
3. වත්කම් - හිමිකම්    4. වත්කම් + හිමිකම්

19. ''විවිධ ආයෝජන ආදායම් ලෙස රු. 85 000 ක් චෙක්පතකින් ලැබීම්'' ගණුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය නිවැරදිව දැක්වෙන්නේ,

| | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| 1. | + 85 000 | = | + 85 000 | | - |
| 2. | + 85 000 | = | - 85 000 | | - |
| 3. | - | = | + 85 000 | | - 85 000 |
| 4. | + 85 000 | = | - | | + 85 000 |

20. අමල්ගේ ව්‍යාපාරයේ හිමිකම වෙනස්වීමට බලපාන ගණුදෙනුව වන්නේ,
1. රු. 20 000 ක් වටිනා ලී බඩු මිලදී ගැනීම
2. රු. 8 000 කට කාර්යාල උපපකරණ ණයට ගැනීම
3. රු. 2 000 ක් ණයගැතියන්ගෙන් මුදල් ලැබීම
4. අමල් ව්‍යාපාරයෙන් රු. 3 000 ක් පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම

21. ලෙජරයේ ඇති ගිණුම් වර්ග නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

1. වත්කම්, වගකීම්, ගැනිලි, ආදායම්, වියදම්
2. ආදායම්, වියදම්, වත්කම්, වගකීම්, මුදල්
3. වත්කම්, වගකීම්, හිමිකම්, ආදායම්, වියදම්
4. ආදායම්, වියදම්, වත්කම්, විකුණුම්, හිමිකම්

22. ව්‍යාපාරයක ලෙජරයේ දැක්වෙන විකුණුම් ගිණුම ......①....... ගිණුමක් වන අතර ණයහිමි ගිණුම ......②....... ගිණුමක් වේ.
ඉහත ප්‍රකාශයේ ① හා ② යන ස්ථානවලට අදාළ නිවැරදි යෙදුම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. ආදායම්, වගකීම්
2. ආදායම්, හිමිකම්
3. වගකීම්, හිමිකම්
4. හිමිකම්, වියදම්

23. ව්‍යාපාරයක් රු. 50 000 ක බැංකු ණයක් ලබා ගැනීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

1. මුදල් ගිණුම හර රු. 50 000
   බැංකු ගිණුම බැර රු. 50 000
2. බැංකු ණය ගිණුම හර රු. 50 000
   මුදල් ගිණුම බැර රු. 50 000
3. මුදල් ගිණුම හර රු. 50 000
   බැංකු ණය ගිණුම බැර රු. 50 000
4. බැංකු ගිණුම හර රු. 50 000
   මුදල් ගිණුම බැර රු. 50 000

24. ලෙජරය යනුවෙන් අදහස් වන්නේ,

1. අත්පිට ගණුදෙනු පමණක් ඇතුළත් පොතයි
2. ගිණුම් සියල්ල ඇතුළත් පොතයි
3. පොදු ජ' නලය හඳුන්වන තවත් නමකි
4. ණය ගණුදෙනු පමණක් ඇතුළත් කරන පොතයි

25. ජනසෙත ව්‍යාපාරය සිය ණයහිමියකු වූ රංගට චෙක්පතකින් ගෙවීම සටහන් කිරීමට අදාළ වන්නාවූ මූලික පොත වන්නේ,

1. ගැනුම් ජ'නලය වේ
2. මුදල් ගිණුම වේ
3. පොදු ජ' නලය වේ
4. බැංකු ගිනුම වේ

26. ජනිදු ව්‍යාපාරයේ 2020.01.31 දිනට සුළු වියදම් වල එකතුව රු. 9 500 කි. ඉතිරි ශේෂය රු. 500 කි. පෙබරවාරි මස පළමු දින සිට අග්‍රිමය රු. 2 000 කින් වැඩි කිරීමට තීරණය කරන ලදි. ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය වනුයේ,

1. රු. 10 000 කි
2. රු. 2 500 කි
3. රු. 12 000 කි
4. රු. 11 500 කි

27. ''ණයගැතියෙකු වූ තුෂාරගෙන් රු. 800 ක වට්ටම් අඩු කොට රු. 8 500 ක මුදල් ලැබීම්'' මෙම ගණුදෙනුවට අදාළ නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

1. ණයගැති ගිණුම හර රු. 8 500
   මුදල් පොත බැර රු. 8 500

2. ණයගැති ගිණුම හර රු. 9 300
   ලද වට්ටම් ගිණුම බැර රු. 800
   මුදල් පොත බැර රු. 8500

3. මුදල් පොත හර රු. 8500
   දුන් වට්ටම් ගිණුම හර රු. 800
   ණයගැති ගිණුම බැර රු. 9 300

4. මුදල් පොත හර රු. 8500
   ණයගැති ගිණුම බැර රු. 8 500

28. පොදු ජ'නලයට අදාළ මූලාශ්‍ර ලේඛනය වන්නේ,

1. සුළු මුදල් වවුචරයයි
2. ජ' නල් වවුචරයයි
3. ගෙවීම් වවුචරයයි
4. ලදුපතයි

29. පියල් ලංකා බැංකුවේ ජංගම ගිණුමක් හිමි ව්‍යාපාරිකයෙකි. සෑම මාසයක් අවසානයේදී ම පියල්ගේ ගිණුමට බැංකුව විසින් කල හර කිරීම්, බැර කිරීම් සහ ශේෂය දැක්වෙන වාර්තාවක් පියල්ට එවනු ලැබේ.එම වාර්තාව හඳුන්වනු ලබන්නේ,

1. සෘජු ප්‍රේෂණ නමිනි
2. බැංකු අයිරාව නමිනි
3. බැංකු ප්‍රකාශනය නමිනි
4. සංශෝධිත බැංකු ගිණුම නමිනි

30. ඉහත වාර්තාව ලැබීමෙන් පසු බැංකු ගිණුමේ සංශෝධිත ශේෂය ලබා ගැනිමට පියල්ට අවශ්‍ය වන අයිතම ඇතුළත් පිළිතුර වන්නේ,

1. සෘජු ප්‍රේෂණ, නිෂ්කාශනය නොවූ චෙක්, බැංකු ගාස්තු
2. ස්ථාවර නියෝග ගෙවීම්, බැංකු ගාස්තු, සෘජු ප්‍රේෂණ
3. බැංකු ගාස්තු, බැංකු අයිරා, සෘජු ප්‍රේෂණ
4. ස්ථාවර නියෝග ගෙවීම්, සෘජු ප්‍රේෂණ, බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්

31. රෙදිපිළි වෙලඳසැලකට ගිය සහන්ට රු. 2 500 ක් ලෙස ලකුණු කරන ලද කමිසයක් මිලදී ගැනීමේ දී 10% ක වට්ටමක් ලැබුණි. මෙහි දී අඩු කරනු ලැබූ වට්ටමේ වටිනාකම හා වට්ටම් වර්ගය පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

1. රු. 250, මුදල් වට්ටම්
2. රු. 2250, මුදල් වට්ටම්
3. රු. 2250, වෙළෙඳ වටට්ම්
4. රු. 250 , වෙළෙඳ වට්ටම්

32. ණයගැති බුද්ධිගෙන් මුදල් ලබා ගැනීමේ දී රු. 2500 ක අඩු කිරීමක් කරන ලදි. මෙය ගිණුම්ගත කිරීමට
අදාළ නිවැරදි ලෙජර් ගිණුම් සටහන වන්නේ,

1. බුද්ධි ගිණුම හර රු. 2500
   දුන්වට්ටම් ගිණුම බැර රු. 2500
2. දුන්වට්ටම් ගිණුම හර රු. 2500
   බුද්ධි ගිණුම බැර රු. 2500
3. බුද්ධි ගිණුම හර රු. 2500
   ලද වට්ටම් ගිණුම බැර රු. 2500
4. ලද වට්ටම් ගිණුම හර රු. 2500
   බුද්ධි ගිණුම බැර රු. 2500

33. සමන් ව්‍යාපරයේ ණයහිමියකු වූ දසුන්ට නිකුත් කළ රු. 87 000 ක චෙක්පත අගරු වී ඇත. මෙම අගරු වීමට අදාළ ව ගිණුම් ලිපිකරු විසින් ද්විත්ව සටහන් තබා ඇත. නිවැරදි ද්විත්ව සටහන වනුයේ,

1. බැංකු ගිණුම හර රු. 87 000
   මුදල් පොත බැර රු. 87 000
2. බැංකු ගිණුම හර රු. 87 000
   ණයහිමි ගිණුම බැර රු. 87 000
3. ණයහිමි ගිණුම හර රු. 87 000
   බැංකු ගිණුම බැර රු. 87 000
4. මුදල් ගිණුම හර රු. 87 000
   ණයහිමි ගිණුම බැර රු. 87 000

34. 2019.03.31 දිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ හර ශේෂය රු. 28 500 වූ අතර එදිනට බැංකුවෙන් ලද බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය රු. 25 000 ක් විය. මෙම වෙනසට හේතු වූ ගණුදෙනුව වනුයේ,

1. බැංකුවට සෘජුවම ලැබී ඇති ලාභාංශ රු. 3 500 ක් වේ
2. නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් රු. 3 500 ක් වේ
3. බැංකුවට සෘජුවම ලැබී ඇති ණයගැති ප්‍රේෂණ රු. 3 500 ක් වේ
4. ස්ථාවර නියෝග මත බැංකුව විසින් ගෙවන ලද ණය වාරිකය රු. 3 500 ක් වේ

35. කසුන්ගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි මාසය සඳහා පිළියෙල කළ විකුණුම් ජ'නලය පහත සඳහන් වේ.

විකුණුම් ජ' නලය

| දිනය | ඉන්වොයිසි අංකය | ගැනුම්කරු | වටිනාකම රු. | ලෙ.පි |
|---|---|---|---|---|
| 01/15 | 22 | නිමාලි | 40000 | |
| ..........①........ | | ..........②........ | 40 000 | |

ඉහත විකුණුම් ජ'නලයේ ① හා ② යන ස්ථාන වලට අදාළ නිවැරදි යෙදුම් පිළවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. 01/15 , විකුණුම් ගිණුමට බැර කළා
2. 01/15, නිමල්ගේ ගිණුමට බැර කළා
3. 01/31, විකුණුම් ගිණුමට බැර කළා
4. 01/31, නිමල්ගේ ගිණුමට හර කළා

පහත සඳහන් තොරතුරු ඇසුරරෙන් ප්‍රශ්න අංක 36 හා 37 ට පිළිතුරු සපයන්න.
යතුරුපැදි අලවිකරණ ව්‍යාපාරයක් වන ශාලිකා ට්‍රේඩර්ස් හි සිදු වූ ගණුදෙනු කිහිපයක් පහත දැක්වේ.

A ) රු. 500 000 කට යතුරු පැදියක් අත්පිට මුදලට විකිණීම
B ) අයිතිකරු පාවිච්චි කළ රු. 300 000 ක් වටිනා යතුරු පැදිය නිමල්ට ණයට විකිණීම
C ) රු. 400 000 ක් වටිනා යතුරු පැදිය සඳුන්ට ණයට විකිණීම
D ) අයිතිකරුගේ පාවිච්චිය සඳහා රු. 500 000 ක් වටිනා යතුරු පැදියක් දිළුම්ගෙන් ණයට ගැනීම.

36. ශාලිකා ට්‍රේඩර්ස්හි ව්‍යාපාරයේ විකුණුම් ජ'නලයේ සටහන් කරන ගණුදෙනුව වන්නේ,

1. A 2. B 3. C 4. D

37. ඉහත ගනුදෙනු අතුරෙන් D ගණුදෙනුව සටහන් කරන මූලික සටහන් පොත සහ මූලාශ්‍ර ලේඛනය පිළිවෙලින් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. ගැනුම් ජ'නලය සහ ඉන්වොයිසිය
2. ගැනුම් ජ'නලය සහ ජ'නල් වවුචරය
3. මුදල් පොත සහ ගෙවීම් වවුචරය
4. පොදු ජ'නලය සහ ජ'නල් වවුචරය

38. ශේෂ පිරික්සුමක හර තීරුවේ ශේෂ පමණක් ඇති ගිණුම් ඇතුලත් පිළිතුර තෝරන්න.

1. ලී බඩු ගිණුම, විදුලි ගාස්තු ගිණුම, මුදල් ගිණුම, ණයගැති ගිණුම
2. ලී බඩු ගිණුම, ප්‍රාග්ධන ගිණුම, මුදල් ගිණුම, විදුලි ගාස්තු ගිණුම
3. මුදල් ගිණුම, ණයහිමි ගිණුම, විකුණුම් ගිණුම, රක්ෂණ ගාස්තු ගිණුම
4. ප්‍රාග්ධන ගිණුම, විකුණුම් ගිණුම, ලද වට්ටම් ගිණුම, ණයහිමි ගිණුම

39. ව්‍යාපාරයක් 2019/12/31 දින පිළියෙළ කළ ශේෂ පිරික්සුමේ හර තීරුවේ එකතුව රු. 900 000 ක් වූ අතර බැර තීරුවේ එකතුව රු. 910 000 කි. මෙම වෙනසට හේතු වූ ගිණුම්කරණයේ දී සිදු වූ වරද වන්නේ,

1. විදුලි ගාස්තු ගිණුමේ එකතුව රු. 10 000 කින් වැඩි වීමයි
2. ගැනුම් ගිනුමේ එකතුව රු. 10 000 කින් වැඩි වීමයි
3. විකුණුම් ගිණුමේ එකතුව රු. 10 000 කින් වැඩි වීමයි
4. ලද වට්ටම් ගිණුමේ එකතුව රු. 10 000 කින් අඩු වීමයි

40. ව්‍යාපාරය විසින් රක්ෂණ ගාස්තු ලෙස රු. 8 000 ක් ගෙවා ඇති අතර එය රක්ෂණ ගාස්තු ගිණුමේ රු. 8 800 ක් ලෙස සටහන් කර තිබුණි. එම වරද නිවැරදි කිරීමට අදාළ ද්විත්ව සටහන වනුයේ,

1. රක්ෂණ ගාස්තු ගිණුම - හර 800
   අවිනිශ්චිත ගිණුම - බැර 800
2. අවිනිශ්චිත ගිණුම - හර 800
   රක්ෂණ ගාස්තු ගිණුම - බැර 800
3. රක්ෂණ ගාස්තු ගිණුම - හර 8000
   මුදල් ගිණුම - බැර 8000
4. රක්ෂණ ගාස්තු ගිණුම - හර 8000
   අවිනිශ්චිත ගිණුම - බැර 8000

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

**11 - ශ්‍රේණිය**

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II**

**නම/විභාග අංකය : ..................................................................**

**උපදෙස් :**

- **පළමුවන ප්‍රශ්නය අතුළුව I කොටසින් ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

විදේශ රටක රියදුරෙකු ලෙස සේවය කොට උපයාගත් මුදලින් තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සිහින දකිමින් සිටි සුරේෂ් ලංකාවට පැමිණ පාසල් සිසුන් ප්‍රවාහනය සඳහා බස් රථයක් යොදවා 2018.01.01 දින "සිහින ට්‍රැවල්ස්" ව්‍යාපාරය ආරම්භ කරන ලදි. නගරය අවට පාසල් විශාල සංඛ්‍යාවක් පැවතීම නිසා ඉතා පහසුවෙන් පාරිභෝගිකයින් සොයා ගැනීමට සුරේෂ්ට හැකි විය. එසේම මෙම රථය තුළ පාසල් දරුවන්ට විනෝදජනක කෙටි ක්‍රීඩාවල යෙදිය හැකි කුඩා උපකරණ සවිකර තිබීමත්, ආසන සංඛ්‍යාවට පමණක් සිසුන් ලබාගැනීමත්, කාරුණික සේවාවත් නිසා දැඩි ඉල්ලුමක් සිහින ට්‍රැවල්ස් වෙත ලැබුණි.

සුරේෂ් විසින් ආනයනය කළ රු. 5 000 000 ක් වටිනා බස් රථය හා ඉතිරි කරගත් රු. 2 000 000 ක මුදල 2018.01.01 ව්‍යාපාරය සඳහා යොදවන ලදි.

2018 ජනවාරි මාසය තුල සිදු වූ ගණුදෙනු පහත දැක්වේ.

| | |
|---|---|
| • බස් රථ ආදායම් | රු. 150 000 |
| • රියදුරු වැටුප් | රු. 30 000 |
| • රියදුරු සහායක වැටුප් | රු. 15 000 |
| • විනෝදජනක ක්‍රීඩා උපකරණ සඳහා | රු. 90 000 |
| • ඉන්ධන සඳහා | රු. 15 000 |

i. අ) සහන ට්‍රැවල්ස් ආයතනය සපයන මිනිස් අවශ්‍යතාවය කුමක් ද?

ආ) මෙම ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත් ද?

ii. මෙම ව්‍යාපාරයේ දැකිය හැකි ශක්තීන් ලියන්න.

iii. මෙම ව්‍යාපාරයේ දැකිය හැකි ව්‍යාපාර අවස්ථාවක් ලියන්න.

iv. මෙම ව්‍යාපාරයේ නාමය ලියාපදිංචි කිරීම සම්බන්ධව ඔබේ අදහස කුමක් ද?

v. සිද්ධියේ සඳහන් ඇල්මැති පාර්ශව දෙකක් ලියන්න.

vi. 2018.01.01 දිනට ගිණුම්කරණ සමීකරණය අගයන් සහිතව දක්වන්න.

vii. සිද්ධියේ සඳහන් වන ගණුදෙනුවලට අදාළ මූලික පොත කුමක් ද?

viii. 2018.01.01 දිනට මුදල් ශේෂය කොපමණ ද?

ix. මෙම ව්‍යාපාරයේ දැකිය හැකි ජංගම නොවන වත්කම් අගයන් සහිතව දක්වන්න.

x. රු. 30 000 ක රියදුරු වැටුප් ගෙවීමට අදාළ ද්විත්ව සටහන ලියන්න.

(ලකුණු 2x10=20)

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

02. i. අවශ්‍යතා හා වුවමනා යන පදවල අර්ථය වෙන වෙනම පැහැදිළි කරන්න. (ලකුණු 02)

ii. ව්‍යාපාර අභ්‍යන්තර පරිසරයේ දැකිය හැකි ශක්තීන් හා දුර්වලතා සඳහා නිදසුන් දෙක බැගින් සඳහන් කරන්න. (ලකුණු 02)

iii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ) ඇල්මැති පාර්ශවයක් ලෙස ගණුදෙනුකරුවන්ගේ අරමුණ වන්නේ නිෂ්පාදන සාධාරණ මිලට ලබා ගැනීම හා ගුණාත්මක නිෂ්පාදන ලබා ගැනීම වේ.

ආ) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයට අයත් වන්නේ අයිතිකරුවන්, සැපයුම්කරුවන් හා කළමනාකරුවන්ය

ඇ) නිෂ්පාදනයේ දී ආධාර කර ගන්නා මිනිසා විසින් සකස් කරන ලද දෑ ප්‍රාග්ධනය ලෙස දැක්විය හැකය.

ඈ) යම් රටක මුදල් ඒකකයක් තවත් රටක මුදල් ඒකක සමඟ හුවමාරුවන අනුපාතිකය පොළී අනුපාතිකය වේ.

(ලකුණු 02)

iv. අ) බාහිර පරිසරය අධ්‍යයනය කිරීමේ දී ව්‍යාපාර ආයතනයකට ඇති තර්ජන දෙකක් දක්වන්න.

ආ) ව්‍යාපාර කටයුතු පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන් දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 02)

(මුළු ලකුණු 08)

03. i. අ) වෙළෙඳාම යනු කුමක් ද?

ආ) තොග වෙළෙඳාමේ ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ) ලාභ ලැබීමේ අරමුණින් ව්‍යාපාරත් පොදුවේ පවත්වාගෙන යන පුද්ගලයන් අතර පවත්නා සම්බන්ධතාව සංස්ථාපිත සමාගමක් ලෙස හැඳින්වේ.

ආ) වගකීම අසීමිත, අඛණ්ඩ පැවැත්මක් හා නෛතික පුද්ලභාවයක් නොමැති පහසුවෙන් ඇරඹිය හැකි එකම ව්‍යාපාර සංවිධානය වන්නේ ඒක පුද්ගල ව්‍යාපාරයි.

ඉ) ශ්‍රී ලංකා වරාය අධිකාරිය රාජ්‍ය සංස්ථාවකට නිදසුනකි.

ඊ) චමත් පෙරේරා 'සිරිසඳ' නමින් තම ව්‍යාපාරය පවත්වා ගෙන යයි. මෙය ලියාපදිංචි කළ යුතුය.

(ලකුණු 02)

iii. පහත දැක්වෙන්නේ ව්‍යාපාර නාම කිහිපයකි.

A වෙනුර සහ අනුර සමාගම
B ලක්නද ස්ටෝර්ස්
C සී.ස අරලිය සමාගම
D ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

ඉහත එක් එක් ව්‍යාපාරය අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ග නම් කරන්න. (ලකුණු 02)

iv. හවුල් ව්‍යාපාරයක දක්නට ලැබෙන වාසි දෙකක් හා අවාසි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

04. i. බැංකු අයිරාවක් යනු කුමක් ද? (ලකුණු 02)

ii. අ) වාණිජ බැංකුවක පවත්වාගෙන යන ගිණුම් වර්ග දෙකක් නම් කරන්න.
ආ) චෙක් පතක් සම්බන්ධයෙන් සාමාන්‍ය රේඛනය හා විශේෂ රේඛනය අතර වෙනස දක්වන්න.
(ලකුණු 02)

iii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ) දේපළ රක්ෂණ ඔප්පුව පැවරිය හැකිය.

ආ) ජීවිත රක්ෂණය සඳහා හානිපූර්ණ මූලධර්ම බලපායි.

ඉ) ආයතනය තුල විවිධ මාධ්‍ය භාවිතා කරමින් පණිවුඩ තොරතුරු හා අදහස් හුවමාරු කර ගැනීම අභ්‍යන්තර සන්නිවේදනය වේ

ඊ) චෙක්පත අණකරු සැම විටම වාණිජ බැංකුවකි. (ලකුණු 02)

iv. සුනිමල් හම්බන්තොට ප්‍රදේශයේ පැණි කොමඩු තොග වශයෙන් ගෙන බෙලිඅත්ත සිට දුම්රියක් මඟින් ඒවා කොළඹට ප්‍රවාහනය කර තම ලොරි රථය මඟින් කොළඹ පිහිටි පලතුරු කඩවලට බෙදාහරියි.

අ) මෙහි සඳහන් වන ප්‍රවාහන මාර්ගයන් සහ ඊට අදාල මාධ්‍ය සඳහන් කරන්න.

ආ) සුනිමල් ඔහුගේ ලොරි රථ මඟින් බෙලිඅත්තේ සිට කොළඹට පැණි කොමඩු ප්‍රවාහනය නොකර දුම්රිය මඟින් ප්‍රවාහනය කිරීමෙන් ඔහුට අත්වන වාසියක් සහ අවාසියක් ලියන්න.
(ලකුණු 02)

(මුළු ලකුණු 08)

## II කොටස - ගිණුම්කරණය

05. i. අ) ව්‍යාපාරයක වගකීම යනු කුමක් ද?
ආ) ව්‍යාපාර අයිතිකරුගේ හිමිකම වෙනස් වීමට බලපාන කරුණු දෙකක් සඳහන් කරන්න.
(ලකුණු 02)

ii. අ) ගිණුම්කරණ තොරතුරු ප්‍රයෝජනවත් වන පාර්ශවයන් දෙකක් සඳහන් කරන්න.
ආ) මූලාශ්‍ර ලේඛනවල අඩංගු කරුණු දෙකක් ලියන්න. (ලකුණු 02)

iii. අ) පහත දැක්වෙන ගණුදෙනු මූලික ගිණුම් සමීකරණයට බලපාන ආකාරය දී ඇති ආකෘතිය ඇසුරෙන් දක්වන්න. (පළමු ගනුදෙනුව ඔබ වෙනුවෙන් සපයා ඇත.)

1. 2019.01.12 රු. 150 000 යොදා ව්‍යාපාරය ඇරඹීම
2. 2019.01.15 රු. 120 000 ගෘහ උපකරණ මිලදී ගැනීම
3. 2019.01.22 රු. 100 000 භාණ්ඩ තොගයක් ණයට ගැනීම
4. 2019.01.26 රු. 250 000 බැංකු ණයක් ලබා ගැනීම
5. 2019.01.30 රු. 25 000 භාණ්ඩ තොගයක් රු. 29 000 කට අත්පිට මුදලට විකිණීම

(ලකුණු 02)

| | දිනය | වත්කම් (රු.) = හිමිකම් (රු.) + වගකීම් (රු.) | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | ගෘහ උපකරණ | භාණ්ඩ තොග | මුදල් | හිමිකම් | ණයහිමියෝ | බැංකු ණය |
| 1 | 19.01.12 | - | - | + 150 000 | + 150 000 | - | - |
| 2 | | | | | | | |
| 3 | | | | | | | |
| 4 | | | | | | | |
| 5 | | | | | | | |

ආ) පහත සඳහන් මූලික සටහන් පොත්වල ගණුදෙනු සටහන් කිරීමේ දී යොදා ගන්නා මූලාශ්‍ර ලේඛන දක්වන්න.

- බැංකු ගිණුම
- මුදල් පොත (ලකුණු 02)

iv. පහත සඳහන් ගණුදෙනු බැංකු ගිණුමක ඇතුලත් කරන්න.

| | |
|---|---|
| 2020/01/01 | ශේෂය රු. 30 000 |
| 2020/01/05 | අත්පිට ගැනුම් සඳහා චෙක්පතක් නිකුත් කළා රු. 10 000 |
| 2020/01/06 | අත්පිට විකුණුම් රු. 8 000 |
| 2020/01/07 | බැංකුවේ මුදල් තැන්පත් කළා රු. 5 000 |
| 2020/01/08 | රක්ෂණ ගාස්තු චෙක්පතකින් ගෙව්වා රු. 4 000 |
| 2020/01/20 | ණයහිමියෙකු වූ විරාජ්ට රු. 3 000 ක් චෙක්පතකින් ගෙව්වා |

(ලකුණු 04)

06. i. අ) මූලික පොත් යනු කුමක්දැයි හඳුන්වන්න.
ආ) මූලික පොත් සඳහා නිදසුන් දෙකක් සපයන්න. (ලකුණු 02)

ii. බැංකු ප්‍රකාශනයක හර තීරුවේ ඇතුළත් වන අයිතම දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

iii. දිල්ෂාන් ව්‍යාපාරයේ බැංකු ගිණුමේ 2020/01431 දිනට ශේෂය රු. 25 000 ක් විය.
බැංකු ප්‍රකාශනයේ ශේෂය එයට වෙනස් විය. එයට හේතු පහත දැක්වේ.

- ✱ බැංකු ගිණුමේ සටහන් නොවූ සෘජු ප්‍රේෂණ රු. 4 000
- ✱ ස්ථාවර නියෝග අනුව ගෙවීම් රු. 1 000
- ✱ තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත් රු. 2 500
- ✱ නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත්වල වටිනාකම රු. 3 000

අවශ්‍ය වන්නේ,

අ) 2020/03/31 දිනට බැංකු ගිණුම සංශෝධනය කිරිම
ආ) 2020/03/31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය

07. i. පහත දැක්වෙන්නේ ගණුදෙනු ගැනුම් ජ'නලයේ සටහන් වී ඇති ආකාරයි.

ගැනුම් ජ'නලය

| දිනය | ඉ.අ | විස්තරය | ලෙ.පි | වටිනාකම රු. |
|---|---|---|---|---|
| 01/05 | | නිමාලි | | 4 000 |
| 01/15 | | කමනි | | 2 000 |
| 01/31 | | ගැනුම් ගිණුමට හර කලා | | 6 000 |

මෙය ලෙජර් ගිණුම් වලට ඇතුලත් කර දක්වන්න. (ලකුණු 04)

ii. අ) ශේෂ පිරික්සුමේ සමානත්වයට බල නොපාන වැරදි වර්ග 02 ක් දක්වන්න.

ආ) පහත දැක්වෙන වැරැද්ද නිවැරදි කිරීමට අදාල ජ'නල් සටහන දක්වන්න. (ලකුණු 04)

- රු. 20 000 ක ගැනුම් ඉන්වොයිසියක් සටහන් කිරීම ගිණුම්පොත් වලින් මගහැරී තිබීම.
(ලකුණු 02)

iii. 2019.12.31 දිනට කිත්සිරි ගේ ව්‍යාපාරයේ ලෙජර් ගිණුම් තුලනය කර ලබාගත් ශේෂ පහත දැක්වේ.

| | |
|---|---|
| මුදල් | 30 000 |
| ගැනුම් | 150 000 |
| විකුණුම් | 225 000 |
| 2019.01.01 තොගය | 40 000 |
| ණයගැතියෝ | 35 000 |
| ණයහිමියෝ | 39 000 |
| විදුලි ගාස්තු | 2 000 |
| ලී බඩු උපකරණ | 35 000 |
| ලද වට්ටම් | 6 000 |
| දුන් වට්ටම් | 3 000 |
| මෝටර් රථ | 400 000 |
| බැංකු ණය | 100 000 |
| විවිධ ආදායම් | 85 000 |
| ප්‍රාග්ධනය | 240 000 |

ඉහත ශේෂ ඇසුරින් 2019.12.31 දිනට ශේෂ පිරික්සුම පිළියෙල කරන්න. (ලකුණු 04)

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

### ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය 11 ශ්‍රේණිය - පිළිතුරු

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | **3** | 11 | **2** | 21 | **3** | 31 | **4** |
| 02 | **1** | 12 | **2** | 22 | **1** | 32 | **2** |
| 03 | **2** | 13 | **4** | 23 | **3** | 33 | **2** |
| 04 | **2** | 14 | **3** | 24 | **2** | 34 | **4** |
| 05 | **3** | 15 | **1** | 25 | **4** | 35 | **3** |
| 06 | **3** | 16 | **3** | 26 | **3** | 36 | **3** |
| 07 | **3** | 17 | **4** | 27 | **3** | 37 | **4** |
| 08 | **2** | 18 | **2** | 28 | **2** | 38 | **1** |
| 09 | **4** | 19 | **1** | 29 | **3** | 39 | **3** |
| 10 | **2** | 20 | **4** | 30 | **2** | 40 | **2** |

**(ලකුණු 1x40=40)**

**I - පත්‍රය**

01. i. අ) ප්‍රවාහනය

ආ) ඒක පුද්ගල ව්‍යාපාර **(ලකුණු 1x2=02)**

ii. ශක්තීන් - මූල්‍ය ශක්තිය
පලපුරුද්ද
සුවිශේෂී සේවය **(ලකුණු 02)**

iii. අවස්ථා - නගරය අවට පාසල් බහුල වීම **(ලකුණු 02)**

iv. ලියාපදිංචිය අනිවාර්ය වේ.

හේතුව - තමාගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නමකින් ව්‍යාපාරය පවත්වාගෙන යන නිසා **(ලකුණු 02)**

v. අයිතිකරු/ සුරේෂ්

සිසුන්/ පාරිභෝගිකයින්

සේවකයින්

ප්‍රජාව **(ලකුණු 1x2=02)**

vi.

| | වත්කම් | = | | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|---|
| මුදල් | 2 000 000 | = | ප්‍රාග් | 2 000 000 | + | - |
| බස්රථය | 5 000 000 | = | ප්‍රාග් | 5 000 000 | + | - |
| | 7 000 000 | = | | 7 000 000 | | - |

**(ලකුණු 1x2=02)**

vii. මුදල් පොත **(ලකුණු 02)**

viii. මුදල් ශේෂය 2 000 000/= **(ලකුණු 02)** නැතහොත්,

මුදල් පොත

| | | | |
|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම | 2 000 000 | රියදුරු වැටුප | 30 000 |
| ආදායම් | 150 000 | සහායක වැටුප් | 15 000 |
| **(ලකුණු 01)** | | ක්‍රීඩා උපකරණ | 90 000 |
| | | ඉන්ධන | 15 000 |
| | | ප/ගේ/ශේෂය | 2 000 000 |
| | 21 500 000 | | 21 500 000 |

**(ලකුණු 01)**

**(ලකුණු 02)**

ix. බස් රථය රු. 5 000 000
ක්‍රීඩා උපකරණ රු. 90 000

x. රියදුරු වැටුප් ගිණුම හර රු. 30 0000
මුදල් ගිණුම බැර රු. 30 000 **(ලකුණු 02)**

**(ලකුණු 2x10=20)**

02. i. අවශ්‍යතා - මිනිසා විසින් අනිවාර්යයෙන්ම සපුරාගත යුතු දෑ **(ලකුණු 01)**

වුවමනා - අවශ්‍යතා සපුරා ගැනීමට යොදා ගන්නා විවිධ ආකාර හෝ ස්වරූප වේ. **(ලකුණු 01)**

ii.

| ශක්තීන් | දුර්වලතා |
|---|---|
| 01. ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් තිබීම<br>02. කළමනාකරුවන්ගේ අත්දැකීම්<br>03. සේවකයින්ගේ විශේෂිත දැනුම හා කැපවීම<br>04. සුවිශේෂී නිෂ්පාදන ක්‍රම<br>05. පිළිගත් සන්නම් නාමයක් තිබීම | 01. පුහුණු සේවකයන්ගේ හිගය<br>02. තාක්ෂණික දැනුම යාවත්කාලීන නොවීම<br>03. සේවක අයහපත් ආකල්ප<br>04. අයිතිකරුවන්ගේ මූල්‍ය ශක්තිය ප්‍රමාණවත් නොවීම<br>05. ව්‍යාපාරයේ භූගෝලීය පිහිටීම නුසුදුසු වීම |
| **(ලකුණු 1/2 x 2= ලකුණු 01)** | **(ලකුණු 1/2 x 2= ලකුණු 01)** |

iii. අ) සත්‍ය
ආ) අසත්‍ය
ඇ) සත්‍ය
ඈ) අසත්‍ය **(1/2 x 4=ලකුණු 02)**

iv. අ) 1. ජාත්‍යන්තර වෙළෙඳ සම්බාධක පැනවීම
2. ස්වාභාවික ආපදා
3. තරඟකරුවන් බිහිවීම
4. නව තාක්ෂණික ක්‍රම සඳහා අනුගත වීම දුෂ්කර වීම

**(කරුණු 02 ක් සඳහා ලකුණු 02)**

ආ) අයිතිකරුවන් සේවකයෝ
කළමනාකරුවන් රජය
ගණුදෙනුකරුවන් ප්‍රජාව
සැපයුම්කරුවන්
තරඟකරුවන් **(පිළගත හැකි ඕනෑම කරුණක්)**

**(1/2 x 2= ලකුණු 01)**
**(මුළු ලකුණු 08)**

03. i. අ) භාණ්ඩ හා සේවා මිලට ගැනීම හා විකිණීම වෙළෙඳාම වේ. **(ලකුණු 01)**

ආ) නැවත විකිණීම සඳහා මිලදී ගැනීම

විශාල ප්‍රමාණයෙන් ණයට ගැනීම හා විකිණීම

සාපේක්ෂ ඒකක මිල අඩු වීම

තෝරාගත් භාණ්ඩ ප්‍රමාණය සැපයීම

බහුලව වෙළෙඳ වට්ටම් ලබා දීම **(1/2 ෘ 2= ලකුණු 01)**

ii. අ) අසත්‍යයි
ආ) අසත්‍යයි
ඉ) සත්‍යයි
ඊ) සත්‍යයි **(1/2 ෘ 4=ලකුණු 02)**

iii. A හවුල් ව්‍යාපාර

B ඒක පුද්ගල ව්‍යාපාර/ හවුල් ව්‍යාපාර

C සංස්ථාපිත සමාගම්

D රාජ්‍ය සංස්ථා (1/2 ෘ 4=ලකුණු 02)

iv.

| වාසි | අවාසි |
|---|---|
| පහසුවෙන් ආරම්භ කල හැකි වීම<br>වැඩි ප්‍රාග්ධනයක් රැස්කර ගත හැකි වීම<br>හවුල්කරුවන්ගේ දක්ෂතා ප්‍රයෝජනයට ගත හැකි වීම<br>වගකීම් බෙදී යාම<br>සාමූහික තීරණ ගත හැකි වීම | අසීමිත වීම<br>ලාභය බෙදී යාම<br>අඛණ්ඩ පැවැත්මක් නැති වීම<br>මතභේද ඇති වීම<br>නෛතික පුද්ගලභාවයක් නොමැතිවීම |

**(1/2 ෘ 2=ලකුණු 01)** **(1/2 ෘ 2=ලකුණු 01)**

**(මුළු ලකුණු 08)**

04. i. බැංකු අයිරාවක් යනු ගිණුමේ පවතින ශේෂය ඉක්මවා චෙක්පත් නිකුත් කළ විට බැංකුව එම චෙක්පත් වලට ගෙවීම නිසා ගිණුම්හිමියා බැංකුවට ණයගැති වන අගය වේ. **(ලකුණු 02)**

ii. අ) ස්ථාවර තැන්පතු
ජංගම ගිණුම්
ඉතිරි කිරීමේ ගිණුම් **(දෙකක් නම් කිරීමට ලකුණු 01)**

ආ) සාමාන්‍ය රේඛණය යනු චෙක්පතක මුහුණත හරහා සරල සමාන්තර රේඛා දෙකක් ඇඳීමය. විශේෂ රේඛනය යනු චෙක්පත මුහුණත හරහා සමාන්තර රේඛා දෙකක් ඇතිව හෝ නැතිව වාණිජ බැංකුවක නමක් යෙදීම වේ. **(ලකුණු 01)**

iii. අ) සත්‍ය

ආ) අසත්‍ය

ඉ) සත්‍ය

ඊ) අසත්‍ය **(ලකුණු 02)**

iv. අ) මහාමාර්ගය - ලොරි රථ

දුම්රිය මාර්ග - දුම්රිය **(ලකුණු 01)**

ආ) වාසි -
පිරිවැය අවම වීම
භාණ්ඩ වැඩි ප්‍රමාණයක් ප්‍රවාහනය කළ හැකි වීම

අවාසි-
ගමනාන්තය දක්වා යොදා ගත නොහැකි වීම
ඕනෑම වේලාවක දුම්රිය සේවාව ලබා ගත නොහැකි වීම

**(2x4 = ලකුණු 02)**

**(මුළු ලකුණු 08)**

05. i. අ) අතීත ගණුදෙනුවක හෝ සිදු විමක ප්‍රතිඵලයක් ලෙස ඇති වන ව්‍යාපාර විසින් ගෙවිය යුතු අගය වගකීම් ලෙස හඳුන්වයි. **(ලකුණු 01)**

ආ) අමතර ප්‍රාග්ධනය යෙදීම/ අතිරේඛ ප්‍රාග්ධනය යෙදීම

ගැනිලි

වියදම් දැරීම

ආදායම් ලැබීම

අලාභය හෝ ලාභය **(1/2x2= ලකුණු 01)**

ii. අ)
- ව්‍යාපාර හිමිකරුවන්
- රජය
- කළමනාකරුවන්
- ණයහිමියන්
- ගණුදෙනුකරුවන් **(1/2x2= ලකුණු 01)**

ආ)
- ව්‍යාපාරයේ නාමය
- ගණුදෙනුවේ මූල්‍ය වටිනාකම
- අනුක්‍රමික අගය
- ගණුදෙනුවට සම්බන්ධ අනෙකුත් පාර්ශවය
- ගණුදෙනුවට සම්බන්ධ විස්තරය
- ගණුදෙනුව සම්බන්ධ වගකීම භාරගත් නිලධාරීයාගේ අත්සන **(1/2x2= ලකුණු 01)**

iii. අ)

| | දිනය | වත්කම් (රු.) | | = හිමිකම් (රු.) | + වගකීම් (රු.) | | |
|---|---|---|---|---|---|---|---|
| | | ගෘහ උපකරණ | භාණ්ඩ තොග | මුදල් | හිමිකම් | ණයහිමියෝ | බැංකු ණය |
| 1 | 19.01.12 | - | - | + 150 000 | + 150 000 | - | - |
| 2 | 01.15 | +120 000 | - | - 120 000 | - | - | - |
| 3 | 01.22 | - | + 100 000 | - | - | + 100 000 | - |
| 4 | 01.26 | - | | + 250 000 | - | - | 250 000 |
| 5 | 01.30 | - | - 25 000 | - 29 000 | + 4 000 | - | - |

**(ලකුණු 02)**

(1/2)
(1/2)
(1/2)
(1/2)

ආ)

- බැංකු ගිණුම - පිලිපත/ ගෙවීම් වවුරය, බැංකු ප්‍රකාශය, තැන්පත් කිරීමේ කුවිතාන්සිය,
- අගරු චෙක් නිවේදනය
- මුදල් පොත - ලදුපත, ගෙවීම් වවුවරය **(ලකුණු 02)**

iv. බැංකු ගිණුම

| දිනය | විස්තරය | ස.පි | වටිනාකම (රු.) | දිනය | විස්තරය | ස.පි | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|
| 20/01/01 | ශේෂය | | 30 000 (1/2) | 20/01/05 | ගැනුම් | | 10 000 (1/2) |
| 20/01/07 | මුදල් | | 5 000 (1/2) | 20/01/08 | රක්‍ෂණ ගාස්තු | | 4 000 (1/2) |
| | | | | 20/01/20 | විරාජ් | | 3 000 (1/2) |
| | | | | 20/01/31 | ශේෂය ප/ගේ | | 18 000 (1/2) |
| | | | 35 000 | | | | 35 000 |
| 20/02/01 | ශේෂය ඉ/ගේ | | 18 000 | | | | |

**(ආකෘතියට 1/2)**
**(ලකුණු 04)**

**(මුළු ලකුණු 12)**

06. i. අ) මූලික පොත් යනු මූලාශ්‍ර ලේඛන උපයෝගී කරගෙන ගණුදෙන්වක් ප්‍රථමයෙන් සටහන් කරන පොත්ය. **(ලකුණු 01)**

ආ) මුදල් පොත | බැංකු ගිණුම | පොදු ජ'නලය

ගැනුම් ජ'නලය | විකුණුම් ජ'නලය | සුළු මුදල් පොත

**(1/2x2= ලකුණු 01)**

ii. ගෙවීම් කරන ලද චෙක්පත් | බැංකුවට අයකල ගාස්තු, පොළී, චෙක්පත් ගාස්තු
ස්ථාවර නියෝග ගෙවීම් | බැංකුව විසින් සිදුකළ වැරැද්දක් **(ලකුණු 02)**

iii. අ)

බැංකු ගිණුම

| | | | |
|---|---|---|---|
| 2020/01/31 ශේෂය | 25 000 (01) | ස්ථාවර නියෝග ගෙවීම් | 1 000 (01) |
| සෘජු ප්‍රේෂණ | 4 000 (01) | 20401/31 ශේෂය ප/ගෙ | 28 000 (01) |
| | 29 000 | | 29 000 |
| 2020/02/01 ශේෂය ඉ/ගෙ | 28 000 | | |

**(ලකුණු 04)**

ආ) දිල්ෂාන්ගේ ව්‍යාපාරය
2020/01/31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය

| | රු. | රු. |
|---|---|---|
| බැංකු ගණුමේ සංශෝධිත ශේෂය | | 28 000 (01) |
| එකතු කළා | | |
| නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් | 3 000 | 3 000 (01) |
| අඩු කළා | | 31 000 |
| තැන්පත් කල නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත් | 2 500 (01) | 2 500 |
| 2020/01/31 දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය | | 28 500 (01) |

**(ලකුණු 04)**
**(මුළු ලකුණු 12)**

07. i.

| ගැනුම් ගිණුම | |
|---|---|
| 01/31 ණයහිමියෝ 6000 | |

**(ලකුණු 02)**

| නිමාලි ගිණුම | |
|---|---|
| | 01/05 ගැනුම් 4000 |

**(ලකුණු 01)**

| කමනි ගිණුම | |
|---|---|
| | 01/15 ගැනුම් 2000 |

**(ලකුණු 01)**

**(ලකුණු 04)**

ii. අ) 1. ගණුදෙනුවක් සම්පූර්ණ පොත් වලින් මඟ හැරීම

2. ගණුදෙනුවක වටිනාකම මූලික පොත්වල වැරදියට සටහන් වීම

3. එකම ගණුදෙනුව ගිණුම් පොත්වල දෙවරක් සටහන් වීම

4. කිසියම් ගණුදෙනුවක වටිනාකම නියමිත ගිණුමේ සටහන් නොකර වෙනත් ගිණුමක සටහන් වීම **(1ඃ2= ලකුණු 02)**

ආ)

| දිනය | ව.අ | විස්තරය | ලෙ.පි | හර (රු.) | බැර (රු.) |
|---|---|---|---|---|---|
| | | ගැනුම් ගිණුම හර<br>ණයහිමියෝ<br>(රු. 20 000 ගැනුම් ඉන්වොයිසිය පොත්වල සටහන් නොවීමේ වරද නිවැරදි කිරීම) | | 20 000 | 20 000 |

**(නිවැරදි ජ'නල් සටහනට ලකුණු 01)**

**(සංක්‍ෂයට ලකුණු 01)**

iii.

කිත්සිරි ව්‍යාපාරය
2019.13.31 දිනට ශේෂ පිරික්සුම

| විස්තරය | ස.පි | හර (රු.) | බැර (රු.) |
|---|---|---|---|
| මුදල් | | 30 000 | |
| ගැනුම් | | 150 000 | |
| විකුණුම් | | | 225 000 |
| 2019.01.01 තොගය | | 40 000 | |
| ණයගැතියෝ | | 35 000 | |
| ණයහිමියෝ | | | 39 000 |
| විදුලි ගාස්තු | | 2 000 | |
| ලී බඩු උපකරණ | | 35 000 | |
| ලද වට්ටම් | | | 6 000 |
| දුන් වට්ටම් | | 3 000 | |
| මෝටර් රථ | | 400 000 | |
| බැංකු ණය | | | 100 000 |
| විවිධ ආදායම් | | | 85 000 |
| ප්‍රාග්ධනය | | | 240 000 |
| | | 695 000 | 695 000 |

ව්‍යාපාරයේ නම, දිනට යන වැකි ඇතුලත් නිවැරදි ආකෘතියට ලකුණු 01

නිවැරදි හර සටහන් 8/7 ට ලකුණු 01

ඊට අඩු නම් ලකුණු 1/2

නිවැරදි බැර සටහන් 6/5 ලකුණු 01

ඊට අඩු නම් ලකුණු 1/2

තුලනය කර ලබා ගත් නිවැරදි එකතුවට ලකුණු 01

(ලකුණු 04)


(මුළු ලකුණු 12)


අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර පොත් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට


www.lol.lk
Learn Ordinary Level


LOL.lk online Book Store


අමතන්න - 071 777 4440/0756999990/071 8540371












































# LOL.lk
online Book Store

071 777 4440/0756999990/071 8540371


## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## කෙටි සටහන් පොත්




**වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට**

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

ප්‍රශ්නපත්‍ර පොත්
ගෙදරටම ගෙන්ව ගන්න
ඔන්ලයින් ඕඩර් කරන්න
WWW.LOL.LK
වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal VISA MasterCard DISCOVER
NO PAYPAL ACCOUNT NEEDED!

ONLINE
BOOK STORE

An evening of fun for young readers

